# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1062/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 26/06/2024 පැය 1150

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2024.06.26 වන අද දින ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය විසින් ඔවුන්ගේ වෘත්තීයට පවතින ගැටළු කිහිපයක් සඳහා විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලා කොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිට උද්ඝෝෂණයක් පවත්වා පා ගමනින් ජනාධිපති ලේකම් කාර්යාලයට හෝ මුදල් අමාත්‍යාංශය වෙත පැමිණ එම ස්ථානයේද උද්ඝෝෂණයක් පවත්වා සංදේශයක් භාර දීමට සූදානම් කර ඇති බවට කොටුව පොලිස් ස්ථානාධිපතිවරයාට තොරතුරක් ලැබී ඇත.

ඒ අනුව එම උද්ඝෝෂණකරුවන්ට කොටුව පොලිස් වසමේ කොටුව දුම්රිය ස්ථානයේ සිට CTO හන්දිය දක්වා වන ඕල්කට් මාවත, CTO හන්දියේ සිට සෙරමික් හන්දිය NSA වටරවුම දක්වා ඇති ලෝටස් මාර්ගයද, යෝර්ක් වීදිය, බැංකු මාවත, චැතැම් වීදිය, මුදලිගේ මාවත, බාරොන් ජයතිලක මාවත, බාලදක්ෂ මාවත, චෛත්‍ය පාර, ජනාධිපති මාවත, ගාලු මුවදොර වටරවුමේ සිට NSA වටරවුම දක්වා ගාලු පාරද, ඔස්සේ ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, ජනාධිපති මන්දිරය වෙතද මාර්ගවලට ඇතුළු වීම වලක්වාලමින් ආඥාවක් නිකුත් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව කොටුව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව ගරු අධිකරණය මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා පහත සඳහන් වග උත්තරකරුවන් වන

1. ජෝශප් ස්ටාර්ලින්, ලංකා ගුරු සංගමයේ ලේකම්
2. මහින්ද ජයසිංහ, ලංකා ගුරු සේවා සංගමයේ ලේකම්.
3. ආර්.පී.අමිල සඳරුවන්, ඒකාබද්ධ ගුරු සේවා සංගමයේ උප ලේකම්.
4. වාස් ගුණවර්ධන, ඒකාබද්ධ ගුරු සේවා සංගමයේ සභාපති.
5. පූජ්‍ය උලපනේ සුමංගල හිමි, අධ්‍යාපන වෘත්තිකයින්ගේ සංගමයේ සභාපති.
6. මයුර සේනානායක, ලංකා ප්‍රගති ගුරු සංගමයේ ලේකම්.
7. පූජ්‍ය යල්වල පඤ්ඤාසේකර හිමි, සමස්ත ලංකා එක්සත් ගුරු සංගමයේ සභාපති.
8. පී.එම්.පුංචිහෙට්ටි, ස්වාධීන ලංකා ගුරු සංගමයේ සභාපති.
9. මොහාන් පරාක්‍රම වීරසිංහ, ශ්‍රී ලංකා ජාතික විදුහල්පති සංගමය.

ඉහත අයවලුන් හා ඔවුන්ගේ සාමාජිකයින් හා සහභාගී වන වෙනත් තැනැත්තන් වෙත 2024.06.26 වන අද දින පැය 1000 සිට පැය 1800 අතර කාලයේ දී කොටුව පොලිස් වසමේ

සෙරමික් හන්දියේ සිට NSA වටරවුම දක්වා මාර්ගයේද, NSA වටරවුමේ සිට බාලදක්ෂ මාවත දක්වා ගාලු පාරද අවහිර නොකරන ලෙසත් මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, මහ බැංකුව, ජනාධිපති මන්දිරයට අයුතු ලෙස ඇතුළු වීම වලකින ලෙසත්, සන්දේශ භාර දීම සඳහා ඉතා සුළු කණ්ඩායමකට පමණක් වගකිවයුතු රජයේ නිලධාරියෙකු නීත්‍යානුකූලව ලබා ගත් අවසරයක් මත ඇතුළු වීමට මෙය බාධාවක් නොවන බවත්, පොදු හා පුද්ගලික දේපල වලට හානි නොකරන ලෙසටත් අධිකරණ ආඥාවක් නිකුත් කර ඇත.

මෙම ආඥාව කඩ කිරීම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 185 වගන්තිය ප්‍රකාරව දඬුවම් ලැබිය හැකි වරදක් වන අතර ඒ අනුව ඉහත අධිකරණ නියෝගය කඩ කරන පුද්ගලයන්ට එරෙහිව පොලිසිය විසින් නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**